# ඔබේ අයිතීන් දැනගන්න

එක්සත් ජනපදයේ සේවය කරන අතරතුර ඔබේ අයිතිවාසිකම් පිලිබඳ විස්තර ඇතුළත් පත්‍රිකාව


**ජාතික මිනිස් ජාවාරම් ක්ෂණික ඇමතුම් අංකය**

**1-888-373-7888 (එක්සත් ජනපදය තුල)**











# ඔබේ අයිතීන් දැනගන්න

ඔබට එක්සත් ජනපදයේ ප්‍රතිලාභදායක දිවිපැවැත්මක් ලැබෙනු ඇතැයි අපට විශ්වාසයි. කෙසේ වෙතත් ඔබට යම් අයහපත් / කටුක / දුෂ්කර / අයුතු තත්ත්වයන් හට මුහුණදීමට සිදු වුවහොත්, ඔබට අයිතිවාසිකම් ඇති අතර ඔබට උපකාර ලබා ගත හැකිය!

### ඔබට ඇති අයිතීන් :

- සාධාරණ වැටුපක් ලබා ගැනීමට
- වෙනස්කම් කිරීම් වලින් නිදහස්ව සේවය කිරීමට
- ලිංගික හිංසනයෙන් හා ලිංගික සූරාකෑමෙන් නිදහස්ව සේවය කිරීමට
- සෞඛ්‍ය සම්පන්න සහ ආරක්ෂිත සේවා ස්ථානයක් හිමි කර ගැනීමට
- වෘත්තීය සමිති, සංක්‍රමණික සහ කම්කරු අයිතිවාසිකම් කණ්ඩායම් වලින් උදව් ඉල්ලා සිටීමට
- අපවාදාත්මක රැකියා තත්වයක් අත්හැර දැමීමට

ඔබට අයුතු ලෙස සලකනු ලැබුවහොත්,
ජාතික මිනිස් ජාවාරම් ක්ෂණික ඇමතුම් අංකය අමතන්න
1-888-373-7888 (එක්සත් ජනපදය තුළ), 233733 ට “HELP”
ලෙස සඳහන් කල කෙටි පණිවිඩයක් යොමු කරන්න (එක්සත් ජනපදය තුළ) එසේත් නොමැති නම් *NHTRC@POLARISPROJECT.ORG* වෙත විද්‍යුත් තැපෑලක් යොමු කරන්න.

භාෂා 200 කට වඩා වැඩි ගණනකින් ඔබට උපකාර කිරීමට පුහුණු විශේෂඥයන් නිරතුරුවම සූදානම්වල සිටී. මෙහිදී ඔබට ඔබගේ නම ලබාදීමට හෝ හඳුන්වාදීමක් සිදුකිරීමට අවශ්‍ය නොවේ. වැඩි විස්තර දැන ගැනීම සඳහා
*WWW.TRAFFICKINGRESOURCECENTER.ORG* වෙත පිවිසෙන්න.

ඔබ හදිසි අන්තරායකර තත්වයකට පත්ව සිටී නම්, 911 (එක්සත් ජනපදය තුළ) ක්ෂණික ඇමතුම් අංකය මගින් පොලිසිය අමතන්න. ඔබේ හදිසි අවස්ථාව, ඔබේ ස්ථානය, ඔබ ඔවුන් අමතන ඔබේ දුරකථන අංකය ඔවුන්ට ලබා දෙන්න/ප්‍රකාශ කරන්න. ඔබ ඉංග්‍රීසි කතා නොකරන්නේ නම් භාෂා පරිවර්තකයෙක් ඉල්ලා සිටින්න. පොලිසිය පැමිණි විට මෙම පත්‍රිකාව ඉදිරිපත්කොට ඔබ විඳි අපචාර පිළිබඳව පොලිසිය දැනුවත් කරන්න.

ඔබට A-3, G-5, H, J, NATO-7, හෝ B-1 ගෘහ සේවක සංක්‍රමණ නොවන වීසා බලපත්‍රලාභියෙකුනම්,මෙම පත්‍රිකාව ඔබේ සම්මුඛ පරීක්ෂණය අතරතුර ඔබට ලැබිය යුතුය. ඔබට වීසා බලපත්‍රයක් ලැබීමට පෙර කොන්සියුලර් නිලධාරියෙකු ඔබට මෙම පත්‍රිකාව ලැබී ඇති බව තහවුරු කළ යුතුය. මෙම පත්‍රිකාවේ අන්තර්ගතය කියවා තේරුම් ගන්න. මෙම පත්‍රිකාව ඔබට ලැබී නොමැති නම්, කොන්සියුලර් නිලධාරියා පත්‍රිකාව ලබා දිය යුතුය, ඔබ සමඟ අන්තර්ගතය සාකච්ඡා කල යුතුය. ඊට අමතරව, පත්‍රිකාවේ ඇති තොරතුරු සම්බන්ධ ඔබට ඇති ඕනෑම ප්‍රශ්නයකට කොන්සියුලර් නිලධාරියා පිළිතුරු දිය යුතුය.



## වීසා තත්ත්වය නොසලකා ඔබගේ අයිතිවාසිකම්

ඔබගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව ඔබ විශ්වාස කරන්නේ නම්, රජයේ ආයතනයක්, වෘත්තීය සමිතියක්, රාජ්‍ය නොවන සංවිධානයක් හෝ වෙනත් ඔබට සහාය විය හැකි සංවිධානයක් වෙත එය වාර්තා කරන්න. ඔබ ඉංග්‍රීසි කතා නොකරන්නේ නම්, භාෂා පරිවර්තකයෙකුගේ සහාය ඉල්ලන්න.

### 1. සාධාරණ ගෙවීමක් ලැබීමට ඇති ඔබේ අයිතිය

- ඔබ කරන සියලුම වැඩ සඳහා ගෙවීමක් ලැබීමට ඔබට අයිතියක් ඇත.
- බොහෝ රැකියා සඳහා ඔබට අවම වශයෙන් ෆෙඩරල් නෛතික අවම වැටුප උපයා ගැනීමට අයිතියක් ඇත. වත්මන් ෆෙඩරල් අවම නෛතික වැටුප සඳහා www.dol.gov/whd/minimumwage.htm බලන්න.
- ෆෙඩරල් අවම වැටුපට වඩා වැඩි මුදලක් උපයා ගැනීමට ඔබට හිමිකම් තිබිය හැක:
  - ඔබ වැඩ කරන්නේ ඉහළ අවම වැටුප් අගයක් ඇති ප්‍රාන්තයක, නගරයක හෝ ප්‍රදේශයක නම්.
  - ඔබගේ රැකියා කොන්ත්‍රාත්තුව/වීසා වැඩසටහනට ඉහල මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වන විටදී.
- ඔබට අතිකාල දීමනා සඳහා හිමිකම් ඇත. සතියකට පැය 40කට වඩා වැඩ කරන ඕනෑම පැයක් සඳහා ඔබේ පැයක වැටුප මෙන් එකහමාරගුණයක් අතිකාල දීමනා ලෙස ගෙවීමට හිමිකම් ඇත. උදාහරණයක් ලෙස, ඔබේ සාමාන්‍ය වැටුප් අනුපාතය පැයකට ඩොලර් 10 නම්, ඔබ එක් සතියක් තුළ පැය 40 ට වඩා වැඩ කරන සෑම අතිකාල/ අමතර පැයකටම ඔබට ඩොලර් 15 ගෙවීමට ඔබේ සේවායෝජකයාට සිදුවේ.
- ඔබගේ සේවායෝජකයා ඔබගේ වැටුපෙන් මුදල් ලබා ගන්නේ නම්, මෙය අඩු කිරීමක් ලෙස හැඳින්වේ .සේවායෝජකයා ඔබේ පඩියෙන් ලබාගත් එක් එක් අඩු කිරීම් මොනවාද යන්න පැහැදිලිව හඳුන්වාදිය යුතුය.
- අඩු කිරීමෙන් පසු නීත්‍යානුකූලව අවශ්‍ය වැටුප් අනුපාතයට වඩා අඩුවෙන් ඉතිරි වන්නේ නම්, ඔබේ අඩු කිරීම් නීති විරෝධී විය හැකිය. සේවා යෝජකයෙකු සාමාන්‍යයෙන් නිල ඇඳුම්, ආරක්ෂක උපකරණ, අවශ්‍ය මෙවලම් සැපයුම්, උපකරණ හෝ බඳවා ගැනීමේ ගාස්තු සඳහා අඩු කිරීම නොකරනු ඇත. සමහර වීසා කාණ්ඩ සඳහා, නිවාස නොමිලේ ලබා දිය යුතුය
- නීත්‍යානුකූල අඩු කිරීම්වලට සෞඛ්‍යය වැනි ඔබ තෝරා ගන්නා ඒවා ඇතුළත් වේ රක්ෂණ, වෘත්තීය සමිති ගාස්තු, හෝ වැටුප් අත්තිකාරම්, මෙන්ම අඩු කිරීම් සඳහා උසාවි නියෝග මත රඳවා ගැනීම් හේතුවෙන් ළමා ආධාර හෝ දික්කසාද දීමනා, බංකොලොත් නඩු සේවා යෝජකයා විසින් රඳවා ගැනීම් සිදු කළ යුතුය. යම් ව්‍යතිරේකයක් හැරුනුකොට, එක්සත් ජනපදයේ සේවය කරන සංක්‍රමණ නොවන වීසා දරන්නන් ෆෙඩරල් සහ ප්‍රාන්ත ආදායම් සහ රැකියා බදු වලට යටත් වේ. ඔබ සහ ඔබේ සේවායෝජකයා සෘජුවම ඔබේ වැටුපෙන් ආදායම් බදු රඳවා ගැනීමට එකඟ විය හැක. ඔබේ සේවායෝජකයා සාමාන්‍යයෙන් රැකියා බදු සමාජ ආරක්ෂණ සහ සෞඛ්‍යාරක්ෂණ ඇතුළුව බදු, කෙලින්ම ඔබේ වැටුපෙන් රඳවා ගනු ඇත.

උපදේශය: අනාගත පරිශීලනය සඳහා මෙම පත්‍රිකාව ඔබ සමඟ එක්සත් ජනපදයට රැගෙන එන්න



උපදේශය: ඔබ එක්සත් ජනපදයේ රැඳී සිටින කාලය අනුව, ඔබට සෞඛ්‍යය රක්ෂණයක් අවශ්‍ය විය හැකිය.එසේම, සමහරවිට සෞඛ්‍ය රක්ෂණයේ පිරිවැය අඩු කිරීමට ලබාදෙන මූල්‍ය ආධාර සඳහා ඔබ සුදුසුකම් ලැබිය හැකිය.

## 2. වෙනස් කොට සැලකීමෙන් නිදහස් වීමට ඔබට ඇති අයිතිය

- ඔබේ සේවායෝජකයා ඔබට වෙනස් ලෙස හෝ නරක ලෙස සැලකීම නීති විරෝධීය. ඔබගේ වයස (ඔබ වයස අවුරුදු 40 හෝ ඊට වැඩි නම්), ස්ත්‍රී පුරුෂ භාවය හෝ ලිංගිකත්වය නිසා ජාතිය, ජාතික සම්භවය සහ වාර්ගිකත්වය, වර්ණය, ආගම, ජානමය තොරතුරු (පවුලේ වෛද්‍ය ඉතිහාසය ඇතුළුව), හෝ ආබාධිතභාවය.
- ඔබ කාන්තාවක් වීම හේතුකොටගෙන, ඔබ ගර්භණී අවස්ථාවේ සිටීම, කිරි දෙන මවක වීම, ගර්භණී අවස්ථාවට පත්වීමට බලාපොරොත්තුවීම හේතුකොටගෙන ඔබේ සේවායෝජකයා ඔබට වෙනස් ලෙස සැලකීමට නොහැක.

## 3. ලිංගික හිංසනයෙන් සහ ලිංගික සූරාකෑමෙන් නිදහස් වීමට ඔබේ අයිතිවාසිකම්

- ඔබේ සේවායෝජකයා ඔබට ලිංගික හිරිහැර කිරීම නීති විරෝධීය. ඔබේ සේවායෝජකයා කිසිදු අහිතකර ලිංගික හෝ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් අදහස් ප්‍රකාශ නොකළ යුතුය.
- ඔබේ සේවායෝජකයා ඔබව ලිංගිකව සූරාකෑම නීති විරෝධීය:
    - ඔබ යම් ලිංගික ක්‍රියාවක් කරන ලෙස ඉල්ලා සිටීම;
    - ලිංගික ආකාරයෙන් ඔබව ස්පර්ශ කිරීම;
    - ඕනෑම ලිංගික ක්‍රියාවක් කිරීමට ඔබට බල කිරීම, රැවටීම හෝ බලපෑම් කිරීම මෙ යටතට ගැනේ.

## 4. සෞඛ්‍ය සම්පන්න සහ ආරක්ෂිත සේවා ස්ථානයක් සඳහා ඔබේ අයිතිය

එක්සත් ජනපදයේ සේවකයෙකු ලෙස ඔබට ආරක්ෂිත, සෞඛ්‍ය සම්පන්න රැකියාවක් කිරීමට අයිතියක් ඇත. මේ යටතට ගැනෙන කරුණු:

- වෛද්‍ය ප්‍රතිකාර: රැකියාවට සම්බන්ධ සිදුවන තුවාල සහ අසනීප ඔබේ සේවායෝජකයාට වාර්තා කිරීමට ඔබට අයිතියක් ඇත. ඔබ රැකියාවේදී තුවාල වී හෝ අසනීප වුවහොත්, ඔබට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත හැක. බොහෝ අවස්ථාවලදී,



උපදේශය: එක්සත් ජනපදයට යාමට පෙර, සංක්‍රමණික සේවක සංවිධාන හෝ හිටපු සංක්‍රමණික සේවකයන්ගෙන් උපදෙස් ලබා ගන්න. ඔබ එක්සත් ජනපදයේ සිටින විට ඔබට ගැටළු හෝ ප්‍රශ්න ඇත්නම් ඔබට සම්බන්ධ කර ගත හැකි පුද්ගලයින්ගේ හෝ සංවිධානවල නම් සහ අංක ඔවුන්ගෙන් ලබා ගත හැක.



රැකියාවට සම්බන්ධ තුවාල හෝ රෝග සඳහා, ඔබේ සේවායෝජකයා නොමිලේ වෛද්‍ය පහසුකම් / ප්‍රතිකාර සහ තුවාල වූ විට අහිමි වූ වැටුපෙන් කොටසක් සැපයිය යුතුය. සේවක වන්දි සඳහා ඔබට ඔබ සේවය කරන ප්‍රාන්තයේ අදාළ ලේඛන ගොනු කිරීමට සිදු විය හැකිය.

- ආරක්ෂක උපකරණ: ඔබ පළිබෝධනාශක හෝ භයානක රසායනික ද්‍රව්‍ය සමඟ හෝ ඒ අවට වැඩ කරන්නේ නම්, රැකියාවට අවශ්‍ය ආරක්ෂක උපකරණ (ශ්වසන හෝ අත්වැසුම් වැනි) ඔබේ සේවායෝජකයා සැපයිය යුතුය / ඒ සඳහා ගෙවිය යුතුය.
- පුහුණුව: ඔබේ සේවා ස්ථානයට අදාළ උපද්‍රව, හානි වැළැක්වීමේ ක්‍රම සහ ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රමිතීන් පිලිබඳව තොරතුරු ලබා ගැනීමට සහ පුහුණුව ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත. අදාළ පුහුණුව ඔබට තේරුම් ගත හැකි භාෂාවකින් සහ වචන මාලාවකින් සමන්විත විය යුතුය.
- නිවාස: ඔබේ සේවායෝජකයා නිවාස ලබා දෙන්නේ නම්, එය ආරක්ෂිත සහ පිරිසිදු විය යුතුයි. වැඩ නොකරන කාලය තුළ ඔබේ නිවසින් පිටවීමට ඔබට අවසර දිය යුතුය.
- නානකාමර: නානකාමර පිරිසිදු හා ප්‍රවේශ වීමේ හැකියාව තිබිය යුතුය. ඔබේ සේවායෝජකයා ඔබට අවශ්‍ය පරිදි නාන කාමර පහසුකම් සඳහා ප්‍රවේශය ලබා දිය යුතුය
- පානීය ජලය: පිරිසිදු පානීය ජලය ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.
- සබන් සහ පිරිසිදු ජලය: ඔබේ අත් සේදීමට ඔබට අයිතියක් ඇත විශේෂයෙන් පළිබෝධනාශක හැසිරවීමෙන් පසු හෝ පළිබෝධනාශක සමඟ ප්‍රතිකාර කළ එළවළු හෝ පලතුරු ඇතුළු රසායනික ද්‍රව්‍ය/ කෘමිනාශක ද්‍රව්‍යය භාවිතයෙන් පසු සබන් සහ ජලය සමග අත් සේදීම අත්‍යාවශ්‍ය වේ.
- හදිසි වෛද්‍ය අවස්ථා: ඔබගේ අසනීප හෝ තුවාල සඳහා වන වෛද්‍ය වියදම් ගෙවිය හැක. ඔබ ඔබේ තුවාල හෝ අසනීපය ගැන ඔබේ සේවායෝජකයාට වහාම පැවසිය යුතුය. ඒ අනුව සේවායෝජකයාට අවශ්‍ය ලේඛන කටයුතු සිදු කළ හැකිය. ඔබ එහි සිටින විට වෛද්‍යවරයා, සායනය හෝ රෝහල, සම්බන්ධ ලිපි ලේඛනවල පිටපත් ඉල්ලා සිටින්න.



**ඔබ පළිබෝධනාශක හෝ භයානක රසායනික ද්‍රව්‍ය සමඟ හෝ ඒ අවට වැඩ කරන්නේ නම්:**

- ඔබ භාවිතා කරන /වැඩ කරන රසායනික ද්‍රව්‍ය පිළිබඳව දැන ගැනීමට සහ අවබෝධ කර ගැනීමට ඔබට අයිතියක් ඇත. ඔබේ සේවායෝජකයා රැකියා ස්ථානයේ රසායනික ද්‍රව්‍ය පිළිබඳව ඔබට අය කිරීමක් මත කරනු ලබන පුහුණුවක් ලබා දිය යුතුය.
- පළිබෝධනාශක ඉසින ලද ස්ථානය සහ ඒ කවදාද යන්න ඔබේ සේවායෝජකයා ඔබට පැවසිය යුතුය. ප්‍රතිකාර කළ ප්‍රදේශයකට නැවත ඇතුල්විය යුතු කාලය දැන ගැනීම මගින් අහඹු නිරාවරණයකට ලක්වීමෙන් වන හදිසි අනතුරු වළක්වා ගත හැක. පළිබෝධනාශක යොදන ප්‍රදේශයක නොසිටීමට වග බලා ගන්න.

## 5. වෘත්තීය සංගම්, සංක්‍රමණික සහ කම්කරු අයිතිවාසිකම් කණ්ඩායම් වලින් උපකාර ඉල්ලා සිටීමට ඔබට ඇති අයිතිය :

- ව්‍යතිරේක කිහිපයක් සමඟින්, ඔබට ඔබේ සේවා සගයන් සමග එකතු වී වැටුප් වැඩි කිරීමට හෝ කාර්ය තත්ත්වයන් වැඩි දියුණු කරන ලෙසට සේවායෝජකයාගෙන් ඉල්ලා සිටීමට අයිතියක් ඇත. ඔබේ සේවා ස්ථානයේ වෘත්තීය සමිතියක් පිහිටුවීමට, සම්බන්ධ වීමට සහ සහාය දීමට ද බොහෝ කම්කරුවන්ට අයිතිය ඇත.
- ඔබ ඔබේ සේවා ස්ථානයේ වැඩ නොකරන විට, ඉහළ වැටුප් හෝ වඩා හොඳ සේවා තත්ත්වයන් සඳහා සහාය දක්වන ප්‍රසිද්ධ දේශන, රැස්වීම් සහ පෙළපාලි සඳහා සහභාගි විය හැකිය.
- ඔබගේ ආගමන තත්ත්වය කුමක් වුවත් ඔබට මෙම අයිතින් ඇත. ඔබගේ අයිතිය තහවුරු කිරීම සම්බන්ධයෙන් සේවායෝජකයාට ඔබට එරෙහිව පියවර ගත නොහැක.

## 6. අපයෝජන සහ සූරාකෑමට ලක් වූ රැකියා තත්වයක් අත්හැරීමට ඔබට ඇති අයිතිය :

- ඔබේ සේවායෝජකයා ඔබව අපයෝජන කරන්නේ නම් ඔබට ඔබේ රැකියාවේ රැඳී සිටීමට අවශ්‍ය නැත. වැදගත්ම දෙය නම් ඔබ අපයෝජනයට ලක් වුවහොත් ඉන් මිදී ආරක්ෂාව සොයා යාමයි.
- ඔබ ඔබේ සේවායෝජකයා හැර ගියහොත්, ඔබේ වීසා තත්ත්වය තවදුරටත් වලංගු නොවේ. කෙසේ වෙතත් ඔබට ඔබගේ වීසා තත්ත්වය හෝ සේවා යෝජකයා වෙනස් කිරීමට හැකි වනු ඇත. ඔබ එසේ කිරීමට එක්සත් ජනපදය හැර යාමට සිදුවිය විය හැකිය. ඔබගේ වීසා තත්ත්වය වලංගු නොවුවද, ඔබ ඔබේ අපයෝජන සේවායෝජකයා හැර ගිය පසු උපකාර ලබා ගත හැක.
- ඔබ වැඩ කරන අතරතුර හෝ ඔබ ඔබේ සේවායෝජකයා හැර ගිය පසු විධිමත් පැමිණිල්ලක් කිරීමට හෝ සේවායෝජකයාට විරුද්ධව නඩුවක් ගොනු කිරීමට ඔබට හැක. ඔබේ සේවායෝජකයා එසේ කිරීම සම්බන්ධයෙන් ඔබට එරෙහිව ක්‍රියාමාර්ගයක් ගන්නේ නම් (හෝ පළිගන්නේ නම්), ඔවුන් නීතිය උල්ලංඝනය කරනු ලැබේ.

උපදේශය: ඔබේ සේවායෝජකයා, කොන්ත්‍රාත්කරු හෝ බඳවා ගන්නන් ලබාදෙන නීති උපදෙස් පක්ෂග්‍රාහී විය හැකිය. ස්වාධීන නීතිඥයෙකුගෙන් උපදෙස් ලබා ගන්න.



# ඔබගේ සංක්‍රමණ නොවන තත්ත්වය මත පදනම්ව ඇති අතිරේක අයිතිවාසිකම්

## A-3, G-5, NATO-7, සහ B-1 ගෘහ සේවකයෝ

- ඔබේ සේවායෝජකයා ඔබට රැකියා ගිවිසුමක් ලබා දිය යුතු අතර එය එක්සත් ජනපද නීතියට අනුකූල විය යුතුය.
- කොන්ත්රාත්තුවේ ගෘහස්තයාට ගෙවිය යුතු පැයක වැටුප සඳහන් කළ යුතුය. පැයක වැටුප එක්සත් ජනපද ෆෙඩරල්, ප්‍රාන්ත හෝ ප්‍රාදේශීය නීතිය යටතේ අවම වැටුප් කොටසේ විශාලතමය විය යුතුය.
- සේවායෝජකයා ඔබට තේරුම් ගත හැකි භාෂාවකින් කොන්ත්රාත්තුවක් ලබා දිය යුතුය. ඔබ කොන්ත්‍රාත්තුවේ නියමයන් දන්නා බවට වග බලා ගන්න සහ ලේඛනයේ සඳහන් දේ ඔබට නොවැටහෙන්නේ නම් අත්සන් නොකරන්න.

## A-3, G-5, සහ NATO-7 ගෘහ සේවකයන් සඳහා වන අමතර අවශ්‍යතා

අවම වශයෙන් කොන්ත්‍රාත්තුවේ පහත සඳහන් විධිවිධාන ඇතුළත් විය යුතුය:

- ඔබේ සේවායෝජකයා විසින් එක්සත් ජනපදයේ සියලුම නීතිවලට අනුකූල වන බවට ලබාදෙන ගිවිසුමක්;
- වැටුප් ගෙවීම් වාර ගණන සහ ආකාරය පිළිබඳ තොරතුරු, වැඩ රාජකාරි, සතිපතා වැඩ කරන වේලාවන්, නිවාඩු දින, අසනීප දින සහ නිවාඩු දින පිළිබඳ තොරතුරු; සහ
- ඔබගේ සේවායෝජකයා විසින් ඔබගේ විදේශ ගමන් බලපත්‍රය,රැකියා කොන්ත්රාත්තුව, හෝ ඔබේ වෙනත් පුද්ගලික දේපල ඔවුන් සන්තකයේ තබා නොගන්නා බවට වන ගිවිසුමක්.

## H-2A තාවකාලික කෘෂිකාර්මික සේවක වීසා

- ඔබ කිසි විටෙකත් කම්කරු බඳවා ගන්නෙකුට ගාස්තු ගෙවිය යුතු නොවේ.
- ඔබට තේරෙන භාෂාවකින් ඔබට ලිඛිත රැකියා ගිවිසුමක් ලැබිය යුතුය. එහි වැටුප්, සේවා කාලය, පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු අඩංගු විය යුතුය. පැය, ප්‍රතිලාභ (ප්‍රවාහනය, නිවාස සහ ආහාර හෝ ඉවුම් පිහුම් ඇතුළුව පහසුකම්), සහ ඔබේ වැටුපෙන් යම් අඩු කිරීම් පිළිබඳව අඩංගු විය යුතුය.
- යම් වැටුප් අනුපාතයකට ගෙවනු ලැබුවද සාධාරණ ලෙස ගෙවීමට ඔබට අයිතියක් ඇත.

- ඔබ රැකියා කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කළ පසු, ඔබේ සේවා ස්ථානයේ සිට ඔබ රැකියාවට පිටත් වූ ස්ථානය දක්වා ඔබේ ආපසු ප්‍රවාහනය සහ දෛනික යැපීම සැපයිය හෝ ගෙවිය යුතුය. පළමු වැඩ සතියේදී ඔබගේ වැටුප එක්සත් ජනපදයේ අවම වැටුපට වඩා අඩු නම්, ඔබගේ වැටුප අඩු වුවහොත් ඔබගේ පැමිණෙන ගමන් සහ වීසා වියදම් ප්‍රතිපූරණය කිරීමට ඔබගේ සේවායෝජකයාට සිදුවිය විය හැක. ඔබගේ සේවායෝජකයා විසින් කිසිදු අයකිරීමකින් තොරව නිවාස පහසුකම් ද ප්‍රවාහන පහසුකම් ද සැපයිය යුතුය.

.

- ඔබගේ H-2A වීසා බලපත්‍රය හා සම්බන්ධව ඔබගේ සේවාවන් සමඟ ගෙවන වන්දි සඳහා එක්සත් ජනපද සමාජ ආරක්ෂණ (Social Security) සහ සෞඛ්‍යාරක්ෂණ (Medicare) බදු වලින් ඔබව නිදහස් කර ඇත.

- සාමාන්‍යයෙන්, ඔබේ සේවායෝජකයා ඔබට සම්පූර්ණ වශයෙන් රැකියා ලබා දිය යුතුය අවම වශයෙන් වැඩ කරන දිනවලින් 3/4 ට සමාන පැය ගණනක කොන්ත්‍රාත් කාලයක් ලබා දිය යුතුය.

## H-2 තාවකාලික කෘෂිකාර්මික-නොවන සේවක වීසා

- ඔබ කිසි විටෙකත් කම්කරු බඳවා ගන්නෙකුට ගාස්තු ගෙවිය යුතු නොවේ.

- ඔබට තේරෙන භාෂාවකින් ඔබට ලිඛිත රැකියා ඇණවුමක් ලැබිය යුතුය. එහි වැටුප්, සේවා කාලය, පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු අඩංගු විය යුතුය. පැය, ප්‍රතිලාභ (ප්‍රවාහනය, නිවාස සහ ආහාර ඇතුළුව හෝ ඉවුම් පිහුම් පහසුකම්), සහ ඔබේ වැටුපෙන් යම් අඩු කිරීම් පිළිබඳ තොරතුරු අඩංගු විය යුතුය.
- සාමාන්‍යයෙන්, ඔබේ සේවායෝජකයා ඔබට සම්පූර්ණ වශයෙන් රැකියා ලබා දිය යුතුය සෑම සති 12-කම වැඩ කරන දිනවලින් අවම වශයෙන් 3/4 ට සමාන පැය/කාල සීමා කාලයක් ලබා දිය යුතුය.

- යම් වැටුප් අනුපාතයකට අනුවගෙවනු ලැබුවද සාධාරණ ලෙස ගෙවීමට ඔබට අයිතියක් ඇත.


- ගිවිසුම් කාලයෙන් අඩක් සම්පූර්ණ කල පසුව ඔබගේ සේවායෝජකයා ඔබට විදේශයන්හි සිට ප්‍රවාහනය සහ ඇතුල්වීම සඳහා වන වියදම් ලබා දීම හෝ ප්‍රතිපූරණය කළ යුතුය.. මීට අමතරව, ඔබ සේවා කාලය සම්පූර්ණ කරන්නේ නම් හෝ කාල සීමාව අවසන් වීමට පෙර කිසියම් හේතුවක් නිසා සේවායෝජකයා ඔබව සේවයෙන් පහ කරනු ලැබුවහොත්. ඔබගේ පළමු වැඩ සතියේ වැටුප,එක්සත් ජනපද අවම වැටුපට වඩා අඩුයි නම්, ඔබේ සේවායෝජකයාට ඔබට වැයවූ පැමිණෙන ගමන් සහ වීසා වියදම් ද ප්‍රතිපූරණය කිරීමට සිදුවිය හැකිය.

## J-1 හුවමාරු සංචාරක වීසා

- ඔබේ වැඩසටහන් දිනයන්, හුවමාරු කාණ්ඩය, ඔබේ අනුග්‍රාහකයාගේ නම සහ ඔබේ හුවමාරු වැඩසටහන පැවැත්වෙන සත්කාරක ආයතනය යන සියල්ල ඔබ අනුමත කළ DS-2019 හි විස්තර කර ඇත.

- ඔබගේ අනුග්‍රාහකයා සියලු වියදම්, කොන්දේසි, සහ ඔබගේ හුවමාරු වැඩසටහනේ සීමාවන් නිවැරදිව පැහැදිලි කළ යුතුය.





උපදේශය: ඔබේ සේවායෝජකයා ඔබට නියමිත වේලාවට ගෙවිය යුතුය. සාමාන්‍යයෙන් සේවකයින් සඳහා එක්සත් ජනපදය සති දෙකකට වරක් වැටුප් ගෙවනු ලැබේ.

## ගිම්හාන වැඩ සංචාරය

- ඔබට පූර්ව-ස්ථානගත රැකියාවක් නොමැති නම්, ඔබ එක්සත් ජනපදයට පැමිණි පසු ඔබේ අනුග්‍රාහකයා ඔබට රැකියාවක් සොයා ගැනීමට සහාය විය යුතුය.

## සීමාවාසික හෝ අභ්‍යාසලාභී

- ඔබේ අනුග්‍රාහකයා ඔබව පුද්ගලිකව, දුරකථනයෙන්, අන්තර්ජාලයෙන් හෝ වෙබ් කැමරා මගින් සම්මුඛ සාකච්ඡා කළ යුතුය.
- ඔබේ අනුග්‍රාහකයා ඔබට සීමාවාසික හෝ අභ්‍යාසලාභී ස්ථානගත කිරීමේ සැලැස්මක් ලබා දිය යුතුය (DS-7002). එහි ඔබට ලැබෙන ආදායම/ගෙවීම් පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් සහ වැඩසටහනේ පුහුණු අරමුණු පිළිබඳ සාරාංශයක් ඇතුළත් වේ. ඔබට සතියකට අවම වශයෙන් පැය 32ක වැඩ ලබා දිය යුතුය.

- ඔබේ අනුග්‍රාහකයා ඔබට වියදම් පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් ලබා දිය යුතුය. එහි ඔබ ගෙවිය යුතු ගාස්තු සහ එක්සත් ජනපදයේ ජීවත් වන විට අදාළ වන ජීවන වියදම් ඇස්තමේන්තුවක් ඇතුළත් විය යුතුය.

- ඔබේ අනුග්‍රාහකයා ඔබට වෛද්‍ය රක්ෂණ ආවරණයක් ඇති බවට සහතික විය යුතුය. ඔබගේ අනුග්‍රාහකයාට මෙය සැපයීමට හෝ ගෙවීමට අවශ්‍ය නැත.

**අන්‍යෝන්‍ය සහයෝගී :** Au pair යනු සත්කාරක පවුලක් සඳහා වැඩ කරන සහ එහි කොටසක් ලෙස ජීවත් වන විදේශීය රටක සහායකයෙකි.

- ඔබේ සත්කාරක පවුල ඔබට පශ්චාත් ද්විතීයික ආයතනයකට ඇතුළත් වීමට සහ පන්තිවලට සහභාගී වීමට උපකාර කළ යුතු අතර එම පන්ති සඳහා පිරිවැය වශයෙන් ඩොලර් 500 දක්වා ගෙවිය යුතුය.
- ඔබට දිනකට පැය 10කට වැඩි කාලයක් හෝ සතියකට පැය 45කට වඩා වැඩ කිරීමට අවශ්‍ය නොවේ.
- ඔබේ උපදේශකයා ඔබ සහ ඔබේ සත්කාරක පවුල සමඟ නිතිපතා සම්බන්ධතා පැවැත්විය යුතුය.

උපදේශය: ඔබ සංචාරය කිරීමට පෙර, සියලුම වැදගත් ලියකියවිලි පිටපත් දෙකක් සාදන්න, විශේෂයෙන්ම ඔබගේ විදේශ ගමන් බලපත්‍රය සහ එක්සත් ජනපද වීසා බලපත්‍රය, ඔබගේ රැකියා කොන්ත්‍රාත්තුව, සහ ඕනෑම අතිරේක හැඳුනුම්පත් ලේඛන. මෙම පිටපත් වලින් එක් කට්ටලයක් ඔබේ මව් රටේ ඔබ විශ්වාස කරන එක් පුද්ගලයෙක් භාරයේ තබන්න. අනෙක් කට්ටලය ඔබ සමඟ රැගෙන යන්න




# ඔබගේ සංක්‍රමණ නොවන වීසා බලපත්‍රය

සංක්‍රමණ නොවන වීසා බලපත්‍රයක් යනු එ.ජ. රජයේ ලේඛනයකි, එමගින් රැකියාව, අධ්‍යාපනය ලැබීමට හෝ සංස්කෘතික හුවමාරු වැඩසටහනකට සහභාගී වීම වැනි යම් අරමුණක් සඳහා එක්සත් ජනපදයට යන පුද්ගලයකුට රටට ඇතුල්වීම සඳහා අවසර දෙනු ලැබේ. ඔබ අයදුම් කරන රටේ පිහිටි එක්සත් ජනපද තානාපති කාර්යාලයෙන් හෝ කොන්සල් කාර්යාලයෙන් වීසා බලපත්‍රයක් සඳහා අයදුම් කළ යුතුය. ඔබ සංක්‍රමණ නොවන වීසා බලපත්‍රයක් ලබා ගත් පසු, ඔබට එක්සත් ජනපදයට ගමන් කළ හැක. එය එක්සත් ජනපදයට ඇතුළත් වීම පිණිස එක්සත් ජනපද ආගමන නිලධාරියෙකුට ඉදිරිපත් කරන්න. ඔබගේ වීසා බලපත්‍රය කල් ඉකුත් වුවහොත්, ඔබ එක්සත් ජනපදයට නැවත ඇතුල් වීමට පෙර නව වීසා බලපත්‍රයක් ලබා ගත යුතුය.

ඔබ එක්සත් ජනපදයට ඇතුල් වූ විට, ආගමන නිලධාරියෙක් ඔබගේ විදේශ ගමන් බලපත්‍රය ඇතුළත් වීමේ දිනය, පන්තිය සහ "ඇතුළත් වන තුරු" දිනය මුද්‍රා කර සලකුණු කරනු ඇත. ඔබ දිගුවක් සඳහා ඉල්ලීමක් ගොනු කරන්නේ නම් මිස, නීතිමය තත්වයේ සිටීම පිණිස ඔබගේ I-94 "ඇතුළු වන තෙක්" දිනට පෙර එක්සත් ජනපදයෙන් ඔබ ඉවත්/බැහැර විය යුතුයි. එසේ නොමැති නම් ඔබට එක්සත් ජනපද පුරවැසිභාවය සහ ආගමන සේවා සමඟ කාලය දීර්ඝ කිරීමක් ගොනු කිරීමට අවශ්‍ය වනු ඇත.




ඔබට මෙම වෙබ් අඩවියෙන් ඔබගේ I-94 වාර්තා පරීක්ෂා කිරීමට හැක https://i94.cbp.dhs.gov





උපදේශය: ඔබ එක්සත් ජනපදයට පැමිණි පසු, ඔබගේ විදේශ ගමන් බලපත්‍රය සහ වෙනත් වැදගත් ලිපි ආදිය ඔබට සැම විටම ඒවාට ප්‍රවේශ විය හැකි ආරක්ෂිත ස්ථානයක තබා ගන්න. ඔබගේ විදේශ ගමන් බලපත්‍රය ඔබගේ සේවායෝජකයා සන්තකයේ තබාගැනීම ගැනීම නීති විරෝධීය.

# නීති විරෝධී මිනිස් ජාවාරම

මිනිස් ජාවාරමේ වින්දිතයින්ට ආරක්ෂාව සහ සේවාවන් සඳහා හිමිකම් ඇත, එසේම, සමහර පොදු ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලැබිය හැකිය. මිනිස් ජාවාරම අපරාධයකි. වාණිජ ලිංගිකත්වය සඳහා ළමුන් සහ වැඩිහිටියන් සූරාකෑම, බලහත්කාරයෙන්, වංචාවෙන් හෝ තර්ජනය සහ ඕනෑම දෙයක් හරහා බලහත්කාර ශ්‍රමය යොදාගැනීම / ලබා ගැනීම මින් අදහස් වේ. එවැනි සූරාකෑමේ අපරාධකරුවන්, එනම් ශ්‍රම ජාවාරම්කරුවන්, තැරැව්කරුවන් සහ වාණිජ ලිංගිකත්ව ගැනුම්කරුවන් ඇතුළත් වන අතර ෆෙඩරල් සහ ප්‍රාන්ත විරෝධී ජාවාරම් නීති යටතේ නඩු පවරනු ලැබේ. කම්කරු ජාවාරම්කරුවන් සහ ලිංගික ජාවාරම්කරුවන්ට සාපරාධී ලෙස නඩු පැවරිය හැකි අතර සිවිල් නඩු වලට මුහුණ දීමට ද සිදුවනු ඇත. පහත දැක්වෙන්නේ මිනිස් ජාවාරම ඇඟවුම් කළ හැකි අනතුරු ඇඟවීමේ සංඥා කිහිපයකි

## තර්ජන සහ අනතුරු ඇඟවීම්

ජාවාරම්කරුවන් සහ ඔවුන්ට උදව් කරන පුද්ගලයින් තර්ජන සහ වෙනත් බියගැන්වීමේ ක්‍රියා භාවිතා කරමින් ඔබ හෝ වෙනත් අය ඔවුන් හැරයාම නැවත්වීමට ක්‍රියා කළ හැකිය. උදාහරණ වශයෙන්:

- පහරදීම්, ශාරීරික හිංසනය හෝ ලිංගික අපයෝජනය;
- පහරදීමේ, ශාරීරික හිංසනය හෝ ලිංගික අපයෝජනය පිළිබඳ තර්ජනය කිරීම;
- ඔබ පිටව යාමට උත්සාහ කළහොත් ඔබට හෝ ඔබේ පවුලට හානි කරන බවට තර්ජන එල්ල කිරීම, වැරදි ලෙස සැලකීම සහ තත්ත්වය පිළිබඳ බලධාරීන්ට වාර්තා කිරීම හෝ උපකාර ඉල්ලා සිටීම නිසා කරනු ලබන තර්ජන;
- උපකාර පැතීම නිසා ඔබව පිටුවහල් කිරීමට හෝ අත්අඩංගුවට ගැනීමට හැකි බවට කරන තර්ජන; හෝ;
- පිටව යාමට උත්සාහ කළ හෝ පැන යාමට උත්සාහ කරන වෙනත් කම්කරුවන්ට තර්ජන හෝ හානියක් සිදු කිරීම හා පැන ගියහොත් ආපසු රැගෙන එන බවට තර්ජනය කිරීම.

## ණය ගෙවීම

ජාවාරම්කරුවන් සහ ඔවුන්ට උදව් කරන පුද්ගලයින් ණය ආපසු ගෙවීම සඳහා ශ්‍රම සේවා හෝ වාණිජ ලිංගික ක්‍රියා (ගණිකා වෘත්තිය) ඔබ ඉටු කරන ලෙස ඉල්ලා සිටිය හැක. සමහර අවස්ථාවලදී ණය නිර්මාණය කර පැටවෙන්නේ ජාවාරම්කරු විසිනි. ඔබට දිගටම ශ්‍රමය සැපයීමට බල කිරීම, සේවා හෝ වාණිජ ලිංගික ක්‍රියා හි නිරතවීමට හෝ හැර යාම වැළැක්වීමට සඳහා ණයක් භාවිතා කිරීමට නීතියට පටහැනිවේ. ජාවාරම්කරුවන් ගෙවීමට අපහසු වන පරිදි ඔබේ ණය හැසිරවිය හැකි අතර ඔබණය ගෙවන තුරු ජාවාරම්කරු යටතේ සේවයේ සිටිය යුතු බව විශ්වාස කිරීමට පෙළඹවිය හැක. ණය හැසිරවීමේ උදාහරණ ඇතුළත් වේ:

- සාධාරණ කාලයක් තුල ගෙවීමට අපහසු හෝ ගෙවා නිම කළ නොහැකි ණයක් පැටවීම සහ එය ඔබ උපයන දේට සමානුපාතික නොවේ;
- ඔබ කලින් එකඟ නොවූ හෝ ඊට වඩා වැඩි ණයක් පැටවීම;
- ණය ගෙවීම සඳහා ඔබේ ඉපැයීම් යෙදවීම/යොදාගැනීම ප්‍රතික්ෂේප කිරීම
- ඔබට ණය ආපසු ගෙවීම සඳහා ජාවාරම්කරුවා තුළ සේවය කොපමණ කාලයක් රැඳී සිටිය යුතුද යන්න නිර්වචනය කිරීම ප්‍රතික්ෂේප කිරීම
- ප්‍රවාහනය, නිවාස, ආහාර සහ ඔබ කලින් එකඟ නොවූ ණය සඳහා ගාස්තු එකතු කිරීම; සහ
- නීති කඩ කිරීම, ප්‍රමාණවත් උපයා නොගැනීම, හෝ ප්‍රමාණවත් ශ්‍රමය, සේවා හෝ වාණිජ ලිංගික ක්‍රියා සිදු නොකිරීම සඳහා ගාස්තු, දඩ හෝ දඩුවම් එකතු කිරීම

## නීති සහ පාලනය

ජාවාරම්කරුවන්, සහ ඔවුන්ට උදව් කරන පුද්ගලයින්, ඔබට සහ අන් අයට ඉවත්ව යාමට, පැමිණිලි කිරීමට හෝ උපකාර පැතීම අපහසු විය හැකි ආකාරයේ නීති සහ පාලන ක්‍රම භාවිතා කළ හැක. උදාහරණ වශයෙන්:

- රැකියා ස්ථානයෙන් පිටවීමට එරෙහි නීති, හෝ ඔබ වැඩ නොකරන විට යාහැකි ගමන් පිලිබඳ දැඩි නීති;
- ඔබගේම විදේශ ගමන් බලපත්‍රය, වීසා බලපත්‍රය, උප්පැන්න සහතිකය හෝ වෙනත් හඳුනාගැනීමේ ලියකියවිලි තබා ගැනීමට එරෙහි නීති;
- ප්‍රමාණවත් ආහාර, නින්ද හෝ වෛද්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීම; හෝ;
- ඔබේ පවුල සමඟ සන්නිවේදනය වැළැක්වීම, සීමා කිරීම හෝ අධීක්ෂණය කිරීම, වෙනත් සේවකයින්, ගනුදෙනුකරුවන් හෝ සේවා ස්ථානයෙන් පිටත වෙනත් පුද්ගලයින්, නීතිමය හෝ සමාජ සේවා ව්‍යාප්ත සේවකයින් සමග සන්නිවේදනය වැළැක්වීම, සීමා කිරීම හෝ අධීක්ෂණය කිරීම

## රැවටීම සහ බොරු කීම

ජාවාරම්කරුවන් සහ ඔවුන්ට උදව් කරන පුද්ගලයින් රැවටීම සහ බොරු භාවිතා කළහැකිය. උදාහරණ වශයෙන්:

- වැඩ වර්ගය, වැඩ කරන වේලාවන්, වැඩ හා ජීවන තත්වයන්, හෝ වැටුප් පිලිබඳ බොරු පොරොන්දු;



උපදේශය: ඔබගේ සේවායෝජකයා ඔබට එරෙහිව කරනු ලබන ඕනෑම නුසුදුසු අදහස් දැක්වීමක් සහ/හෝ ක්‍රියාමාර්ගයක් පිළිබඳ සවිස්තර වාර්තාවක් තබාගන්න. ඒ පිළිබඳව සිටින ඕනෑම සාක්ෂිකරුවෙකුගේ නම් සහ දුරකථන අංක සටහන් කරගන්න.

- හොඳ රැකියාවක් ලබා දෙන බවට පොරොන්දු වී ඔබට ලබා දීම ඊට වඩා සැලකිය යුතු වැඩි කාලයක් දැඩි කොන්දේසි යටතේ වැඩ කිරීමට අවශ්‍ය වීම හෝ පොරොන්දු වූවාට වඩා අඩු වැටුප් ලබා දීම; හෝ;
- හොඳ රැකියාවක් ලබා දෙන බවට පොරොන්දු වී, පසුව ඔබව වෙනත් ආකාරයක කම්කරු සේවා ඉටු කිරීමට සැලැස්වීම, හෝ වාණිජ ලිංගික ක්‍රියා හි නිරත කරවීම; මෙයට හෙද මහාචාර්යවරයෙකු ලෙස රැකියාවක් පොරොන්දු වී, පසුව සාත්තු නිවාසයක හෙද කාර්ය මණ්ඩලයේ වැඩ කිරීමට ඔබට බල කිරීම, හෝ ළමුන් බලාගන්නෙකු (නැනී) ලෙස වැඩ කිරීමට පොරොන්දු වී පසුව ඔබට බල කිරීම විදේශීය නැටුම් හෝ වාණිජ ලිංගික ක්‍රියාවල නිරත වීමට (ගණිකා වෘත්තිය) ඔබට බල කිරීම ඇතුළත් විය හැකිය.
- ඔබට කිසිදු අයිතිවාසිකමක් නැති බව පැවසීම;
- ඔබ උපකාර පැතීමට උත්සාහ කළහොත් අන් අය ඔබව විශ්වාස නොකරන බව හෝ පිටුවහල් කරන බව ඔබට පැවසීම
- ජාවාරම්කරුවෙකුගේ අනන්‍යතාවය ගැන බොරු කීමට ඔබට උපදෙස් දීම

## ඔබ අපයෝජන පිළිබඳව වාර්තා කළහොත් ඔබව රටින් පිටුවහල් කරනවාද?

අපයෝජන වාර්තා කරන පුද්ගලයින් ආරක්ෂා කිරීමට වැඩසටහන් තිබේ. ඔබට ආගමන ගැටළු ඇති වුවද උපකාර පැතීමට බිය නොවිය යුතුයි. ඔබ කළ යුත්තේ ඔබගේ සේවායෝජකයා වෙනුවෙන් වැඩ නොකරන ආගමන නීතිඥයෙකුගෙන් උපදෙස් ලබා ගැනීමයි.

ඔබ මිනිස් ජාවාරමක හෝ ස්ත්‍රී දූෂණය හෝ ලිංගික හිංසනය ඇතුළු වෙනත් බරපතල අපරාධයක ගොදුරක් බවට ඔබ විශ්වාස කරන්නේ නම්, ඔබ වෙනත් ආකාරයක සංක්‍රමණ නොවන තත්ත්වයකට සුදුසුකම් ලැබිය හැකිය. එනම් "T" (වෙළඳාම වින්දිතයින් සඳහා) හෝ "U" (වින්දිතයින් සඳහා ජාවාරම් හෝ වෙනත් බරපතල අපරාධ) සංක්‍රමණ නොවන තත්ත්වය හෝ වෙනත් ආකාරයකින් එක්සත් ජනපදයේ තාවකාලිකව රැඳී සිටීමට අවසර ඇත. මෙම සංක්‍රමණ නොවන වින්දිතයින් ආරක්ෂා කිරීම සඳහා වර්ගීකරණයන් නිර්මාණය කරන ලදී. එක්සත් ජනපදයේ බොහෝ අය T හෝ U සංක්‍රමණ නොවන තත්ත්වය පිළිබඳව නොදන්නා අතර ඔබ ඔවුන් ගැන ඔබට උදව් කරන අයට පැවසීමට අවශ්‍ය විය හැක.

## මිනිස් ජාවාරමට ගොදුරු වූවන් සඳහා ලබා ගත හැකි සේවාවන් මොනවාද?

එක්සත් ජනපදයේ ජාවාරම් වින්දිතයින් ෆෙඩරල් හෝ ප්‍රාන්ත වැඩසටහන් යටතේ ප්‍රතිලාභ, සේවා සහ ආගමන සහන සඳහා සුදුසුකම් ලැබිය හැකිය. බොහෝ සංවිධාන වෛද්‍ය/දන්ත ප්‍රතිකාර ඇතුළු, මානසික සෞඛ්‍ය රැකවරණය, නිවාස, සංක්‍රමණ සඳහා නීතිමය උපකාර සහ වෙනත් නීතිමය අවශ්‍යතා, රැකියා ආධාර සහ මහජන ප්‍රතිලාභ ඇතුළු මෙම සේවාවන් වෙත ප්‍රවේශ වීමට ඔබට උදවු කරනු ඇත.

.

## වැඩිදුර තොරතුරු සඳහා මෙම වෙබ්අඩවි වෙත පිවිසෙන්න:

- වීසා අයදුම් කිරීමේ ක්‍රියාවලිය සහ ඔබගේ ඇ.එ.ජ වීසා බලපත්‍රය: *usvisas.state.gov.*
- මිනිස් ජාවාරම: *www.state.gov/j/tip.*
- J-1 වීසා හුවමාරු වැඩසටහන: *j1visa.state.gov.*
- සමානාත්මතාවය, සහ රැකියාවේදී වෙනස් කොට සැලකීමෙන් නිදහස් වීමට ඔබේ අයිතිවාසිකම් නිසා ඔබේ ජාතිය, වර්ණය, ආගම, ලිංගිකත්වය (ගැබ්ගැනීම් ඇතුළුව), ජාතික සම්භවය, වයස (40 හෝ ඊට වැඩි), ආබාධිත හෝ ජානමය තොරතුරු, සහ ගොනු කිරීමට වෙනස්කම් කිරීමේ චෝදනා ගොනු කිරීමට: *www.eeoc.gov.*
- ඔබගේ සේවා ස්ථානයේ ආරක්ෂණ අයිතිවාසිකම්, හෝ ඔබේ රැකියාව අනාරක්ෂිත යැයි ඔබ සිතන්නේ නම් සහ ඔබ පරීක්ෂණයක් ඉල්ලා සිටීමට අවශ්‍ය නම්: *www.osha.gov.*
- ඔබේ සේවායෝජකයා ඔබේ නොගෙවූ වැටුප් සම්බන්ධයෙන්:*webapps.dol.gov/wow.*
- වැටුප් පැමිණිල්ලක් ගොනු කරන්නේ කෙසේද යන්න ඇතුළුව සාධාරණ ලෙස ගෙවීමට ඔබේ අයිතිවාසිකම්: *www.dol.gov/WHD/immigration*.
- ඔබේ පුරවැසිභාවයේ තත්ත්වය නිසා වෙනස්කම්වලට මුහුණ නොදීමට ඔබට ඇති අයිතිය සහ වෙනස්කොට සැලකීමේ පැමිණිල්ලක් ගොනු කිරීමට: *www.justice.gov/crt/filing-charge.*
- ඔබේ වැටුප් හෝ වැඩ තත්වයන් වැඩි දියුණු කිරීම සඳහා වෙනත් සේවකයින් සමඟ සම්බන්ධ වීමට ඔබට ඇති අයිතිය චෝදනාවක් ගොනු කරන්නේ කෙසේද යන්න ඇතුළුව කොන්දේසි: *www.nlrb.gov.*
- සෞඛ්‍ය රක්ෂණය සඳහා ඔබේ අයිතිවාසිකම්, බැඳීම් සහ නිදහස් කිරීම: *localhelp.healthcare.gov* (ඉංග්‍රීසි) හා *ayudalocal.cuidadodesalud.gov* (ස්පාඤ්ඤ)

**උපදේශය: ඔබ වැඩ කරන සෑම කාලයකම ලිඛිත වාර්තාවක් තබා ගැනීම හොඳ අදහසකි. සටහන් පොතක් ගෙන ඔබ වැඩ කළ දින සහ පැය සියල්ලම සටහන් කරන්න. ඔබට කොපමණ ගෙවා ඇත්ද, ඔබට ගෙවීමක් ලැබුණු දිනයන්, ඔබගේ වැටුපෙන් සිදුකරන ලද කිසියම් අඩු කිරීම් සහ එම අඩු කිරීම් සඳහා හේතු.**

### ආදර්ශ සතිපතා වැඩ සටහන

<table>
<tr><td colspan="2">සේවානියුක්තියා:</td><td colspan="2">අධීක්ෂක:</td></tr>
<tr><th>දිනය</th><th>කාර්ය</th><th>කාලය</th><th>වේතනය</th></tr>
<tr><td></td><td></td><td>පැමිණීම:________<br>පිටවීම:________<br>මුළු: ________</td><td></td></tr>
<tr><td></td><td></td><td>පැමිණීම:________<br>පිටවීම:________<br>මුළු: ________</td><td></td></tr>
</table>



මෙම පත්‍රිකාව විලියම් විල්බර්ෆෝර්ස් හි 202 වගන්තියට අනුව නිර්මාණය කරන ලදී.
2008 වසරේ ජාවාරම් වින්දිතයන් ආරක්ෂා කිරීමේ නැවත බලය පැවරීමේ පනත, මහජන නීතිය 110 – 457